FACTSHEET

PUBLIC TRUSTEE AND GUARDIAN

# ඇටර්නි බලපත්‍ර

## ඇටර්නි බලපත්‍රය

අවශ්‍ය අවස්ථාවල ඔබගේ මූල්‍ය කටයුතු බලා ගැනීමට හෝ පුද්ගලික හෝ වෛද්‍ය තීරණ ගැනීම සම්බන්ධ පුද්ගලික බූදලය සැලසුම් කර ගැනීමේදී ඇටර්නි බලය ලබාදීම වැදගත් අංගයක්වේ. බොහෝ අය, ඉතා ප්‍රමාද වන තෙක්, ඇටර්නි බලකරුවෙකු පත්කිරීම කොතරම් වැදගත්ද යන්න අවබෝධ කර නොගනී.

ඔබගේ අවශ්‍යතාවලට සරිලන ආකාරයට සුදුසු ඇටර්නි බලකරුවෙකු හඳුනා ගැනීමට ඔබට උපකාර කිරීමට මහා භාරකරු සහ භාරකරු උපකාර කරනු ඇත. ඔබට අවශ්‍ය නම්, මූල්‍ය/දේපළ කටයුතු සම්බන්ධයෙන් පමණක්, ඔබගේ ඇටර්නි බලකරු වශයෙන් අපට කටයුතු කල හැකිය.

මෙම අය ඔබගේ ඇටර්නි බලකරු හා සමාන ආකාරයට කටයුතු කරන අතර ACAT හා මහා භාරකරු සහ භාරකරු හට නිති කාලාන්තර ඇතිව වාර්තා කල යුතුය.

ACAT මගින් මහා භාරකරු සහ සහ භාරකරුව ඔබගේ කළමණාකරු වශයෙන් පත්කල හැකිය, නැතිනම් වෙනත් අයෙකු හෝ සංවිධානයක් පත්කල හැකිය. කෙසේ වුවද, මෙම අවස්ථාවේදී ඔබගේ බලාපොරොත්තුව නොදන්නවා විය හැකි අතර පත්කරන අය ඔබ විසින් පත් කිරීමට තෝරා ගන්නා අයෙකු නොවිය හැකිය.

## ඇටර්නි බලපත්‍රයක් යනු කුමක්ද?

ඇටර්නි බලපත්‍රයක් යනු ඔබ ජීවත්ව සිටින අතරතුර ඔබගේ වත්කම් සහ මූල්‍ය කටයුතු කළමණාකරණය කිරීම සඳහා ඔබ විසින් තෝරා ගන්නා අයෙකු හට බලය ලබා දෙන නීත්‍යානුකූල ලියවිල්ලකි. ඔබට අවශ්‍ය නෛතික හැකියාව තිබෙන අතරතුර පැහැදිලි සහ සංක්ෂිප්ත උපදෙස් ලබා දෙමින් අදාල ලියවිල්ල අත්සන් කල යුතුය. ඇටර්නි බලකරු විසින්ද ලියවිල්ල අත්සන් කර පත්වීම පිළිගත යුතුය.

පත්වීම නිශ්චිත කාලයක් සඳහා විය හැකි අතර ඔබට නෛතික හැකියාව ඇති තාක් දුරට ඕනෑම අවස්ථාවක ඔබගේ බලය ඉවත් කර ගත හැකිය.

ඔබ මියයාම සමග ඇටර්නි බලය අවසන්වේ. ඔබගේ අන්තිම කැමති පත්‍රයේ නම් කරන ලද පොල්මක්කරු ඉන්පසුව ඔබගේ බූදලයේ වගකීම භාරගනී.

## ඇටර්නි බලයක් ලබා දිය යුත්තේ ඇයි?

හදිසි අනතුරු, හදිසි අසනීප, සැලසුම් කල හෝ අනපේක්ෂිත අතුරුදහන්වීම් වූ විට, නැතිනම් ඔබට ඔබගේ කටයුතු කරගත නොහැකි විට, ඔබගේ මූල්‍ය කටයුතු කළමණාකරණයට කිසියම් අයෙකු අවශ්‍ය විය හැකිය.

නීතිය මගින් ඔබට ඔබගේ කටයුතු කළමණාකරණය කර ගැනීමට යම් අයෙකු පත්කල හැකිවේ. මෙය ඔබගේ මූල්‍ය කළමණාකරණයේ නිතිපතා කරන කොටසක් වශයෙන් සැලකිය යුතුය. මෙය අනාගත අවශ්‍යතාවයක් බලාපොරොත්තුවෙන්, විශේෂිත අරමුණක් වෙනුවෙන් හෝ සීමාසහිත කාලයකට සිදු කල හැකිය.

ඔබ විසින් පත්කරන අය ඔබගේ ඇටර්නි බලකරු ලෙස හඳුන්වයි. ඔබගේ වත්කම් සහ මූල්‍ය කටයුතු ආරක්ෂා කිරීම හෝ කළමණාකරණය කිරීම සම්බන්ධයෙන් ඒවා ඔබ විසින් කළමණාකරණය කරගත නොහැකි අවස්ථාවක හෝ ඔබගේ නෛතික හැකියාව නොමැතිවූ අවස්ථාවක ඔබ ලබාදුන් උපදෙස් අනුව එම පුද්ගලයා කටයුතු කරයි.



Ground Floor
221 London Circuit
Canberra City ACT 2601

PO Box 221
Civic Square ACT 2608

Tel (02) 6207 9800
Fax (02) 6207 9811

Email ptg@act.gov.au
Web www.ptg.act.gov.au

## නෛතික හැකියාව යනු කුමක්ද?

තමන් අත්සන් කරන ලියවිල්ලේ ස්වභාවය සහ ප්‍රතිඵලය සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් අවබෝධ කර ගැනීමට යම් පුද්ගලයෙකුට ඇති හැකියාව දැක්වීමට මෙය භාවිතා කෙරේ.

හැකියාව ඇති වයස අවුරුදු 18ට වැඩි ඕනෑම අයෙකුට ඇටර්නි බලකරුවෙකු පත්කල හැකිය. හැකියාව සම්බන්ධ යම් සැකයක් ඇතිනම්, වෛද්‍ය වාර්තාවක් ලබාගෙන ඇටර්නි බලපත්‍රය සමග තබා තිබිය හැකිය.

## මාගේ ඇටර්නි බලකරු වශයෙන් කවුරුන් පත්කල යුතුද?

ඇටර්නි බලයක් යටතේ කටයුතු කිරීම අභියෝගාත්මක කාර්යයක් වන අතර විශේෂ නිපුණතා අවශ්‍යවේ. ඔබ තෝරා ගන්නා අය හට ඔබගේ කටයුතු නිසි ලෙස කළමණාකරණය කිරීම සඳහා අවශ්‍ය ව්‍යාපාර සහ මූල්‍ය කටයුතු සම්බන්ධ දැනුම ඇති බවට වග බලා ගත යුතුය. ඔහු හෝ ඇය අවශ්‍ය අවස්ථාවල සිටිය යුතු අතර ඔබගේ සුභසිද්ධිය වෙනුවෙන් අපක්ෂපාතීව කටයුතු කරන නිවැරදි මූල්‍ය වාර්තා තබන අයෙකු විය යුතුය.

ඔබගේ මූල්‍ය කටයුතුවල සම්පූර්ණ පාලනය ඔබගේ ඇටර්නි බලකරු වෙත ලබාදෙනු ඇත. නමුත් ඔබගේ කටයුතු සම්බන්ධයෙන් වෙනත් කිසිවෙකු වෙත වාර්තා කිරීමට ඔබගේ ඇටර්නි බලකරු වෙත කිසිදු නෛතික වගකීමක් නැත.

ඇටර්නි බලකරුවෙකු විසින් පහත ලෙස කටයුතු කල යුතුයඃ

- සිය දේපළවලින් පරිබාහිරව දේපළ කළමණාකරණය කිරීම සහ
- ගනුදෙනුවල නිවැරදි වාර්තා තැබීම

ඔබ විසින් මහා භාරකරු  සහ භාරකරු වැනි ස්වාධීන විශේෂඥයෙකුව පත්කල යුත්තේ කුමන හේතුවක් නිසාද යන්න සලකා බැලීමට හේතු ඇත.

## මා හට ඇටර්නි බලපත්‍රය අවලංගුකල හැකිද?

ඇටර්නි බලපත්‍රය ලබා දෙන අය වශයෙන් ඔබට නෛතික හැකියාව ඇති තාක් දුරට ඇටර්නි බලපත්‍රය අවලංගු කල හැකිය. මෙය ලිඛිතව, www.legislation.act.gov.au වෙබ් අඩවියේ ACT ව්‍යවස්ථා රෙජිස්ටරයේ දක්වා ඇති නියමිත ආකෘතිය භාවිතා කරමින් කල යුතුය. ප්‍රධානියා වශයෙන්, ඔබට හැකියාව ඇති තාක් දුරට නියමිත ආකෘතිය භාවිතා කර ඕනෑම අවස්ථාවක පත්වීම අවලංගු කල හැකිය.

## මේ සඳහා මුදලක් වැයවේද?

ඔව්, මෙම සේවාව සඳහා කුඩා මුදලක් අයකෙරේ. වැඩි විස්තර සඳහා කරුණාකර අපගේ ගාස්තු සම්බන්ධ පොත්පිංච බලන්න.

## ඇටර්නි බලපත්‍ර ආකාර මොනවාද?

### සාමාන්‍ය ඇටර්නි බලපත්‍ර



Ground Floor
221 London Circuit
Canberra City ACT 2601

PO Box 221
Civic Square ACT 2608

Tel (02) 6207 9800
Fax (02) 6207 9811

Email ptg@act.gov.au
Web www.ptg.act.gov.au

සාමාන්‍ය ඇටර්නි බලපත්‍රයක් වලංගු වන්නේ ඔබට නෛතික හැකියාව ඇතිතාක් පමණි. මෙම ආකාරයේ ඇටර්නි බලපත්‍රයක් ප්‍රයෝජනවත් වන්නේ දිගු කාලයකට ඔබ විදේශයකට හෝ ප්‍රාන්තයෙන් පිටත යන අතර ඔබගේ නෛතික හැකියාව නැතිවුවහොත් ඇටර්නි බලපත්‍රය දිගටම තබා ගැනීමට බලාපොරොත්තු වන්නේ නැතිනම් පමණි.

## චිරස්ථායී ඇටර්නි බලපත්‍රය

ආබාධිත බව හෝ අසනීප හේතුවෙන් නෛතික හැකියාව නැති වුවද, චිරස්ථායී ඇටර්නි බලපත්‍රයක් වලංගුව පවතී. මේ මගින් ඔබ විසින් නීත්‍යානුකූල උපදෙස් ලබාදීමට නොහැකි වුවත් ඔබගේ කටයුතු කළමණාකරණය කිරීම ඇරඹීමට හෝ  දිගටම කරගෙන යාමට ඔබගේ ඇටර්නි බලකරු හට බලය ලබාදේ.

කුමන තත්වය යටතේ වුවද, ඔබ විසින් දැන් ඇටර්නි බලකරුවෙකු පත්කර, එම අය විසින් කටයුතු කිරීම ඇරඹීම පසුවට කල් තබයි. මෙම ආකාරයට, ලියවිල්ල පිළියෙල කර, අත්සන් කර තව දුරටත් උපදෙස් ලැබෙන තෙක් බලා සිටී.

ඔබගේ ලිඛිත ඉල්ලීම මත ඇටර්නි බලකරු විසින් එකෙණෙහිම හෝ පසු දිනයක කටයුතු කල හැකිය.

සාමාන සහ චිරස්ථායි ඇටර්නි බලපත්‍ර ආකාර දෙකේදීම ප්‍රධානියාගේ මරණින් පසු බලය අහෝසිවේ.

## විකල්ප ඇටර්නි බලපත්‍ර

ඔබගේ ඇටර්නි බලකරු මියයාම හෝ වෙන හේතුවක් නිසා ඔබ වෙනුවෙන් කටයුතු කිරීමට නොහැකි අවස්ථාවක ඔබගේ වත්කම් සහ ආර්ථික සුබසිද්ධිය වෙනුවෙන් විකල්ප ඇටර්නි බලකරුවෙකු පත් කිරීම ඥාණාන්විතවේ.

මෙම ඇටර්නි බලකරු හට ලිඛිත දැන්වීමක් කිරීමෙන් පසු ඔබගේ ඇටර්නි බලකරු වශයෙන් කටයුතු කිරීම ඇරඹිය හැකිය.

විකල්ප ඇටර්නි බලකරුවෙකු වශයෙන් අවශ්‍ය අවස්ථාවලදී ලබාගත හැකි මහා භාරකාරවරයාද හොඳ තේරීමකි.

## මා විසින් ඇටර්නි බලකරුවෙකු පත් නොකලේ නම් කුමක් සිදුවේද?

ඔබ විසින් ඇටර්නි බලකරුවෙකු පත්කර නොමැතිව ඔබට නෛතික හැකියාව නොමැතිවී ගිය අවස්ථාවක හෝ කිසියම් හේතුවක් නිසා ඔබගේ මූල්‍යමය කටයුතු කළමණාකරණය කරගත නොහැකි අවස්ථාවක, ඔබගේ පුද්ගලික අවශ්‍යතා සඳහා රැකවරණය ලබාදීමට භාරකරුවෙකු පත් කිරීම සහ / හෝ ඔබගේ මූල්‍යමය සහ දේපළ අවශ්‍යතාවයන් සඳහා රැකවරණය ලබා දීමට කළමණාකරුවෙකු පත් කිරීම ACT සිවිල් සහ පරිපාලන පර්ෂදය (ACT Civil and Administrative Tribunal (ACAT)) මගින් සිදුකල හැකිය.



Ground Floor
221 London Circuit
Canberra City ACT 2601

PO Box 221
Civic Square ACT 2608

Tel (02) 6207 9800
Fax (02) 6207 9811

Email ptg@act.gov.au
Web www.ptg.act.gov.au